11 දශම

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,

- හරය දහයේ බලයක් ලෙස ලිවිය හැකි භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස දැක්වීමට,
- දශම සංඛ්‍යාවක් භාග සංඛ්‍යාවක් ලෙස දැක්වීමට සහ
- දශම සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීමට සහ බෙදීමට

හැකියාව ලැබේ.

11.1 හරය දහයේ බලයක් වන තත්‍ය භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ලිවීම

6 ශ්‍රේණියේ දී හරය 10 හෝ 100 හෝ වූ තත්‍ය භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ලියන ආකාරය අපි ඉගෙන ගත්තෙමු.



ඒකකයක් සමාන කොටස් 10කට බෙදා, ලබා ගත් කොටසක් $\frac{1}{10}$ක් වේ.

එය දශම සංඛ්‍යාවක් ලෙස නිරූපණය කරන්නේ 0.1 ලෙස ය.

එනම්, $0.1 = \frac{1}{10}$



ඒකකයක් සමාන කොටස් 100කට බෙදා, ලබා ගත් කොටසක් $\frac{1}{100}$ක් වේ.

එය දශම සංඛ්‍යාවක් ලෙස නිරූපණය කරන්නේ 0.01 ලෙස ය.

එනම්, $0{\cdot}01 = \frac{1}{100}$

ඒකකයක් සමාන කොටස් 1000කට බෙදා, ලබා ගත් කොටසක් $\frac{1}{1000}$ක් වේ.

$\frac{1}{1000}$ දශමස්ථාන භාවිත කරමින් ලියන්නේ 0.001 ලෙසිනි.

එනම්, $0{\cdot}001 = \frac{1}{1000}$

0·001 කියවනු ලබන්නේ බින්දුවයි දශම බින්දුවයි බින්දුවයි එක ලෙසිනි. 0.001හි දෙවන දශමස්ථානයට පසු ව 1 ලියා ඇති ස්ථානය **තෙවන දශමස්ථානය** ලෙස හැඳින්වේ. තෙවන දශමස්ථානයට අදාළ ස්ථානීය අගය $\frac{1}{1000}$ වේ.

$\frac{7}{1000}$ යනු $\frac{1}{1000}$ ඒවා 7ක් බැවින් $\frac{7}{1000} = 0{\cdot}007$ වේ. 0·007 කියවනු ලබන්නේ බින්දුවයි දශම බින්දුවයි බින්දුවයි හත ලෙසිනි.

$\frac{24}{1000}$ සලකමු.

$\frac{24}{1000}$ යනු $\frac{1}{1000}$ ඒවා 24කි. $\frac{24}{1000} = \frac{20}{1000} + \frac{4}{1000}$

$\frac{20}{1000} = \frac{20 \div 10}{1000 \div 10} = \frac{2}{100}$ බැවින්,

$\frac{24}{1000} = \frac{1}{100}$ ඒවා 2 + $\frac{1}{1000}$ ඒවා 4කි.

ඒ අනුව $\frac{24}{1000} = 0{\cdot}024$

0·024 කියවනු ලබන්නේ බින්දුවයි දශම බින්දුවයි දෙකයි හතර ලෙසිනි.

0·024 ගණක රාමුවකින් නිරූපණය කරමු.



නිදසුන 1

(1) පහත දැක්වෙන එක් එක් භාගය දශමස්ථාන භාවිත කරමින් ලියන්න.

(i) $\frac{4}{1000}$ (ii) $\frac{97}{1000}$ (iii) $\frac{751}{1000}$

(i) $\frac{4}{1000} = 0.004$ (ii) $\frac{97}{1000} = 0.097$ (iii) $\frac{751}{1000} = 0.751$

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

11.1 අභ්‍යාසය

(1) පහත සඳහන් එක් එක් භාගය දශම සංඛ්‍යා ලෙස ප්‍රකාශ කරන්න. ගණක රාමුවලින් ද නිරූපණය කරන්න.

(i) $\frac{9}{10}$ (ii) $\frac{75}{100}$ (iii) $\frac{9}{1000}$ (iv) $\frac{25}{1000}$ (v) $\frac{275}{1000}$

11.2 හරය දහයේ බලයක් නොවන තත්‍ය භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ලිවීම

හරය දහයේ බලයක් නොවන තත්‍ය භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස දක්වමු.

- මෙහි දී, දී ඇති භාගයෙහි හරය දහයේ බලයක් වන පරිදි දී ඇති භාගයට තුල්‍ය වූ භාගයක් ලියා ගන්න.
- එම භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

$\frac{1}{2}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වමු.

10, 2න් බෙදේ. 10 ÷ 2 = 5. එම නිසා $\frac{1}{2}$හි ලවයත් හරයත් 5න් ගුණ කිරීමෙන්, එය හරය 10 වූ තුල්‍ය භාගයක් ලෙස ලියා ගත හැකි වේ.

$$\frac{1}{2} = \frac{1 \times 5}{2 \times 5} = \frac{5}{10}$$

$$\frac{5}{10} = 0{\cdot}5$$

එම නිසා, $\frac{1}{2} = 0{\cdot}5$

$\frac{1}{4}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වමු.

10, 4න් නොබෙදෙන නමුත් 100, 4න් බෙදේ. 100 ÷ 4 = 25 වේ.
එම නිසා $\frac{1}{4}$හි ලවයත් හරයත් 25න් ගුණ කිරීමෙන්, එය හරය 100 වූ තුල්‍ය භාගයක් ලෙස ලියා ගත හැකි වේ.

$$\frac{1}{4} = \frac{1 \times 25}{4 \times 25} = \frac{25}{100}$$

$$\frac{25}{100} = 0{\cdot}25$$

එම නිසා, $\frac{1}{4} = 0{\cdot}25$

$\frac{1}{8}$ දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කරමු.

10 සහ 100, 8න් ඉතිරි නැති ව නොබෙදෙන නමුත් 1000, 8න් බෙදේ. $1000 \div 8 = 125$ වේ.

එම නිසා $\frac{1}{8}$හි ලවයත් හරයත් 125න් ගුණ කිරීමෙන්, එය හරය 1000 වූ තුල්‍ය භාගයක් ලෙස ලියා ගත හැකි වේ.

$$\frac{1}{8} = \frac{1 \times 125}{8 \times 125} = \frac{125}{1000}$$

$$\frac{125}{1000} = 0.125$$

එම නිසා, $\frac{1}{8} = 0.125$

ඉහත විස්තර කිරීම්වලට අනුව, හරය 10හි බලයක් ලෙස ලිවිය හැකි තත්‍ය භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස පහසුවෙන් ප්‍රකාශ කළ හැකි වේ.

එනම්, 10, 100, 1000 හෝ දහයේ යම් බලයක් වන සංඛ්‍යාවක් යම් භාගයක හරයෙන් බෙදේ නම්, එම භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලිවිය හැකි ය.

නිදසුන 1

$\frac{1}{5}$, $\frac{13}{25}$ සහ $\frac{77}{125}$ යන එක් එක් භාගය, දශම සංඛ්‍යා ලෙස ප්‍රකාශ කරන්න.

$\frac{1}{5} = \frac{2}{10} = 0.2$

$\frac{13}{25} = \frac{52}{100} = 0.52$

$\frac{77}{125} = \frac{77 \times 8}{125 \times 8} = \frac{616}{1000} = 0.616$

11.3 මිශ්‍ර සංඛ්‍යාවක් දශම සංඛ්‍යාවක් ලෙස ලිවීම

දැන් අපි මිශ්‍ර සංඛ්‍යාවක් දශම සංඛ්‍යාවක් ලෙස ලියන ආකාරය විමසා බලමු.

$3\frac{3}{20}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියමු.

$$3\frac{3}{20} = 3 + \frac{3}{20}$$
$$= 3 + \frac{3 \times 5}{20 \times 5} = 3 + \frac{15}{100}$$
$$= 3 + 0.15$$
$$= 3.15$$

$7\frac{11}{40}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියමු.

$$7\frac{11}{40} = 7 + \frac{11}{40}$$
$$= 7 + \frac{11 \times 25}{40 \times 25}$$
$$= 7 + \frac{275}{1000}$$
$$= 7.275$$

11.4 විෂම භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ලිවීම

විෂම භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ලියන ආකාරය විමසා බලමු.

$\frac{17}{5}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියමු.

I ක්‍රමය

$$\frac{17}{5} = 3\frac{2}{5} = 3 + \frac{2}{5}$$
$$= 3 + \frac{4}{10} = 3 + 0.4$$
$$= 3.4$$

II ක්‍රමය

$$\frac{17}{5} = \frac{34}{10} = \frac{30}{10} + \frac{4}{10}$$
$$= 3 + 0.4$$
$$= 3.4$$

නිදසුන 1

$\frac{9}{8}$ දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කරන්න.

(I) ක්‍රමය

$$\frac{9}{8} = 1 + \frac{1}{8}$$
$$\frac{9}{8} = 1 + \frac{125}{1000}$$
$$= 1 + 0.125$$
$$= 1.125$$

(II) ක්‍රමය

$$\frac{9}{8} = \frac{9 \times 125}{8 \times 125}$$
$$= \frac{1125}{1000} = \frac{1000}{1000} + \frac{125}{1000}$$
$$= 1 + 0.125$$
$$= 1.125$$

11.2 අභ්‍යාසය

(1) පහත දැක්වෙන භාග සහ මිශ්‍ර සංඛ්‍යා, දශම සංඛ්‍යා ලෙස දක්වන්න.

(i) $\frac{3}{5}$ (ii) $\frac{3}{4}$ (iii) $\frac{8}{25}$ (iv) $\frac{321}{500}$ (v) $\frac{39}{40}$

(vi) $13\frac{1}{2}$ (vii) $2\frac{7}{50}$ (viii) $2\frac{1}{8}$ (ix) $3\frac{7}{40}$ (x) $5\frac{14}{125}$

(xi) $\frac{13}{10}$ (xii) $\frac{27}{20}$ (xiii) $\frac{7}{5}$ (xiv) $\frac{97}{8}$ (xv) $\frac{251}{250}$

11.5 දශම සංඛ්‍යාවක් භාගයක් ලෙස ලිවීම

0·5 භාගයක් ලෙස ලියමු.

$0.5 = \frac{5}{10}$

$\frac{5}{10}$ සරල ම ආකාරයෙන් දැක්වීමට හරයත් ලවයත් 5න් බෙදමු.

$0{\cdot}5 = \frac{5}{10} = \frac{5 \div 5}{10 \div 5} = \frac{1}{2}$

0·375 භාගයක් ලෙස ලියමු.

$0{\cdot}375 = \frac{375}{1000}$

$\frac{375}{1000}$ සරල ම ආකාරයෙන් දැක්වීමට, හරයත් ලවයත් 125න් බෙදමු.

$\frac{375}{1000} = \frac{375 \div 125}{1000 \div 125} = \frac{3}{8}$

$0{\cdot}375 = \frac{3}{8}$

1·75 භාගයක් ලෙස ලියමු.

$1{\cdot}75 = 1 + 0{\cdot}75 = 1 + \frac{75}{100} = 1\frac{75}{100}$

$\frac{75}{100}$ සරල ම ආකාරයෙන් දැක්වීමට හරයත් ලවයත් 25න් බෙදමු.

$\frac{75}{100} = \frac{75 \div 25}{100 \div 25} = \frac{3}{4}$

එම නිසා, $1{\cdot}75 = 1\frac{3}{4}$

නිදසුන 1

1.625 භාගයක් ලෙස සරල ම ආකාරයෙන් ප්‍රකාශ කරන්න.

$$1.625 = 1 + 0.625 = 1 + \frac{625}{1000} = 1 + \frac{625 \div 25}{1000 \div 25} = 1 + \frac{25}{40} = 1 + \frac{25 \div 5}{40 \div 5}$$

$$= 1 + \frac{5}{8}$$

$$= 1\frac{5}{8}$$

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

11.3 අභ්‍යාසය

(1) පහත දැක්වෙන එක් එක් දශම සංඛ්‍යාව, භාග ලෙස ලියා, ඒවා සරල ම ආකාරයෙන් ප්‍රකාශ කරන්න.

(i) 0.7 (ii) 1.3 (iii) 0.45 (iv) 8.16
(v) 6.75 (vi) 0.025 (vii) 4.225 (viii) 8.625

11.6 දශම සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීම

$2 \times 3 = 2 + 2 + 2 = 6$ බව ඔබ ඉගෙන ගෙන ඇත.
පූර්ණ සංඛ්‍යාවකින් යම් සංඛ්‍යාවක් ගුණ කිරීම වෙනුවට එකතුවක් ලෙස ලියා පිළිතුර ලබා ගත හැකි බව ඔබ ඉගෙන ගෙන ඇත.

දැන් අපි 0.1×3හි අගය සොයමු.

$$0.1 \times 3 = 0.1 + 0.1 + 0.1$$
$$= 0.3$$

0.8×2හි අගය සොයමු.

$$0.8 \times 2 = 0.8 + 0.8$$
$$= 1.6$$

0.35×4හි අගය සොයමු.

$$0.35 \times 4 = 0.35 + 0.35 + 0.35 + 0.35$$
$$= 1.40$$
$$= 1.4$$

ඉහත ලබා ගත් පිළිතුර පහත දැක්වෙන සටහන ඇසුරෙන් නිරීක්ෂණය කරමු.

$0.1 \times 3 = 0.3$	$1 \times 3 = 3$
$0.8 \times 2 = 1.6$	$8 \times 2 = 16$
$0.35 \times 4 = 1.40$	$35 \times 4 = 140$

එම නිරීක්ෂණය අනුව, දශම සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීමේ දී පහත පියවර අනුගමනය කිරීමෙන් ද පිළිතුර ලැබෙන බව ඔබට පෙනෙනු ඇත.

- දශම සංඛ්‍යාවේ දශමස්ථාන නොසලකා එය පූර්ණ සංඛ්‍යාවක් ලෙස සලකා, දී ඇති පූර්ණ සංඛ්‍යාවෙන් ගුණ කරන්න.
- දශම සංඛ්‍යාවේ දශමස්ථාන ගණනට සමාන දශමස්ථාන ගණනක් එන පරිදි පිළිතුරෙහි දශම තිත තබන්න.

දැන් අපි, 24.31 × 6හි අගය සොයමු.

පළමුව දශමස්ථාන නොසලකා ගුණ කරමු.

$$\begin{array}{r} 2431 \\ \times \quad 6 \\ \hline 14586 \\ \hline \hline \end{array}$$

24.31හි දශමස්ථාන දෙකක් ඇති නිසා පිළිතුරේ දශමස්ථාන දෙකක් එන පරිදි දශම තිත තබන්න. එවිට, 24.31 × 6 = 145.86

ගුණ කිරීමට යොදා ගන්නා පූර්ණ සංඛ්‍යාව විශාල වන විට පුන පුනා එකතු කිරීමේ ක්‍රමයට වඩා ඉහත දෙවනු ව නිරීක්ෂණය කළ ක්‍රමය පහසු බව ඔබට වැටහෙනු ඇත.

නිදසුන 1

4.276 × 12හි අගය සොයන්න.

$$\begin{array}{r} 4276 \\ \times \quad 12 \\ \hline 8552 \\ 4276 \\ \hline 51312 \\ \hline \hline \end{array}$$

4.276හි දශමස්ථාන තුනක් ඇති නිසා පිළිතුරෙහි ද දශමස්ථාන තුනක් සිටින සේ දශම තිත තබනු ලැබේ.

එවිට, 4.276 × 12 = 51.312

11.4 අභ්‍යාසය

(1) අගය සොයන්න.

(i) 2.45 × 6 (ii) 0.75 × 4 (iii) 3.47 × 15

(iv) 15.28 × 13 (v) 0.055 × 3 (vi) 1.357 × 41

• දශම සංඛ්‍යාවක් 10න්, 100න් හෝ 1000න් ගුණ කිරීම

පහත ගුණිත සලකා බලමු.

2.1 × 10 = 21.0	2.1 × 100 = 210.0	2.1 × 1000 = 2100.0
3.75 × 10 = 37.50	3.75 × 100 = 375.00	3.75 × 1000 = 3750.00
23.65 × 10 = 236.50	23.65 × 100 = 2365.00	23.65 × 1000 = 23650.00
43.615 × 10 = 436.150	43.615 × 100 = 4361.500	43.615 × 1000 = 43615.000

මෙම ගුණිතයන් නිරීක්ෂණය කිරීමෙන්, පහත සඳහන් කරුණු අනාවරණය වේ.

- දශම සංඛ්‍යාවක් 10න් ගුණ කළ විට ලැබෙන සංඛ්‍යාව, පළමු දශම සංඛ්‍යාවේ දශම තිත තිබෙන ස්ථානයේ සිට එක් ස්ථානයක් දකුණත් පසට දශම තිත යෙදීමෙන් ලබා ගත හැකි ය. $37.16 \times 10 = 371.6$
- දශම සංඛ්‍යාවක් 100න් ගුණ කළ විට ලැබෙන සංඛ්‍යාව, පළමු දශම සංඛ්‍යාවේ දශම තිත තිබෙන ස්ථානයේ සිට ස්ථාන දෙකක් දකුණත් පසට දශම තිත යෙදීමෙන් ලබාගත හැකි ය. $37.16 \times 100 = 3716$
- දශම සංඛ්‍යාවක් 1000න් ගුණ කළ විට ලැබෙන සංඛ්‍යාව, පළමු දශම සංඛ්‍යාවේ දශම තිත තිබෙන ස්ථානයේ සිට ස්ථාන තුනක් දකුණත් පසට දශම තිත යෙදීමෙන් ලබාගත හැකි ය. $37.160 \times 1000 = 37\,160$

11.5 අභ්‍යාසය

(1) අගය සොයන්න.

(i) 4.74×10	(ii) 0.503×10	(iii) 0.079×10
(iv) 5.83×100	(v) 5.379×100	(vi) 0.07×100
(vii) 1.2×100	(viii) 0.0056×10	(ix) 0.0307×100
(x) 3.7×1000	(xi) 8.0732×1000	(xii) 6.0051×1000

11.7 දශම සංඛ්‍යාවක් 10න්, 100න් හෝ 1000න් බෙදීම

$10 = 5 \times 2$ යනු 10ට පහේ ගොඩවල් 2ක් බව යි.
එම නිසා, 10 සමාන ගොඩවල් දෙකකට බෙදූ විට එක් ගොඩක පහක් තිබේ.

එනම්, $10 \div 2 = 5$
මේ බව ඔබ 6 ශ්‍රේණියේ දී ඉගෙන ගෙන ඇත.



දැන් අපි $32.6 \div 10$හි අගය සොයමු.
$32.6 \div 10$ යනු 32.6ට 10 ඒවා කොපමණ ද යන්නයි.
$3.26 \times 10 = 32.6$ බව අපි දනිමු. එම නිසා,
$32.6 \div 10 = 3.26$

ඉහත සඳහන් කළ ආකාරයට,

$1.4556 \times 100 = 145.56$ බැවින්,
$145.56 \div 100 = 1.4556$ ද,

$6.1273 \times 1000 = 6127.3$ බැවින්,

$6127.3 \div 1000 = 6.1273$ ද වේ.

ඒ අනුව, පහත බෙදීම් විමසා බලමු.

$7871.8 \div 10 = 787.18$	$7871.8 \div 100 = 78.718$	$7871.8 \div 1000 = 7.8718$
$169.51 \div 10 = 16.951$	$169.51 \div 100 = 1.6951$	$169.51 \div 1000 = 0.16951$
$9.51 \div 10 = 0.951$	$9.51 \div 100 = 0.0951$	$9.51 \div 1000 = 0.00951$

මේ අනුව,

- දශම සංඛ්‍යාවක් 10න් බෙදීමේ දී ලැබෙන සංඛ්‍යාව, පළමු සංඛ්‍යාවේ දශම තිත තිබෙන ස්ථානයේ සිට එක් ස්ථානයක් වමත් පසට දශම තිත යෙදීමෙන් ලැබෙන සංඛ්‍යාවට සමාන වේ. $6.7 \div 10 = 0.67$
- දශම සංඛ්‍යාවක් 100න් බෙදීමේ දී ලැබෙන සංඛ්‍යාව, පළමු සංඛ්‍යාවේ දශම තිත තිබෙන ස්ථානයේ සිට ස්ථාන දෙකක් වමත් පසට දශම තිත යෙදීමෙන් ලබා ගත හැකි ය. $006.7 \div 100 = 0.067$
- දශම සංඛ්‍යාවක් 1000න් බෙදීමේ දී ලැබෙන සංඛ්‍යාව, පළමු සංඛ්‍යාවේ දශම තිත තිබෙන ස්ථානයේ සිට ස්ථාන තුනක් වමත් පසට දශම තිත යෙදීමෙන් ලබා ගත හැකි ය. $006.7 \div 1000 = 0.0067 = 0.0067$

11.6 අභ්‍යාසය

(1) අගය සොයන්න.

(i) $27.1 \div 10$ (ii) $1.36 \div 10$ (iii) $0.26 \div 10$ (iv) $0.037 \div 10$
(v) $0.0059 \div 10$ (vi) $58.9 \div 100$ (vii) $3.7 \div 100$ (viii) $97.6 \div 100$
(ix) $0.075 \div 100$ (x) $0.0032 \div 100$ (xi) $4375.8 \div 1000$
(xii) $356.8 \div 1000$ (xiii) $25.67 \div 1000$

• දශම සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් බෙදීම

$7.5 \div 3$හි අගය සොයමු.

☛ පූර්ණ සංඛ්‍යා කොටස බෙදන්න.

☛ දීර්ඝව බෙදාගෙන යෑමේ දී දශම තිතෙන් දකුණත් පස පළමු ඉලක්කම බෙදීමට යොදා ගන්නා විට ම පිළිතුරේ දශම තිත සටහන් කරන්න.

☛ ඉන් අනතුරු ව නැවත බෙදීම සිදු කරගෙන යන්න.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පියවර 1

```
   2
3 |7 . 5
  |6
  |---
  |1
```

7 ÷ 3 = 2යි ඉතිරි 1 යි.

2 × 3 = 6

7 − 6 = 1

පියවර 2

7ට පසුව ඇත්තේ 7.5හි දශම කොටස නිසා පිළිතුරෙහි 2ට පසුව දශම තිත යොදන්න.

```
   2 .
3 |7 . 5
  |6   ↓
  |-----
  |1   5
```

5 පහළට ගන්න.

පියවර 3

```
   2 . 5
3 |7 . 5
  |6   ↓
  |-----
  |1   5
  |1   5
   -----
       0
```

5 × 3 = 15

15 − 15 = 0

එවිට 7.5 ÷ 3 = 2.5

නිදසුන 1

(i) 182.35 ÷ 7හි අගය සොයන්න.

```
   26.05
7 |182.35
  |14
  -----
    42
    42
    ---
     03
     00
     ---
      35
      35
      ---
       0
```

දශම තිතෙන් දකුණත් පස 3 බෙදීමට යොදා ගන්නා විට ම පිළිතුර සඳහා දශම තිත තබන්න.

(ii) 0.672 ඳු 12හි අගය සොයන්න.

```
    0.056
12 |0.672
   |0
   -----
   |0 6
     0
   -----
     67
     60
    ----
      72
      72
     ----
       0
```

0.672 ÷ 12 = 0.056

(iii) 2.13 ÷ 4හි අගය සොයන්න.

```
   0.5325
4 |2.1300
  |0
  ------
  |2 1
   2 0
  ------
     1 3
     1 2
    -----
      10
       8
     ----
      2 0
      2 0
     =====
```

2.13 ÷ 4 = 0.5325

අමතර දැනුමට

```
   2 . 5
3 |7 . 5
   6
   1  5
   1  5
      0
```

7.5හි එකස්ථානයේ ඉලක්කම 7 වේ. එනම්, 1 ඒවා 7කි.

7, 3න් බෙදූ විට 2යි ඉතිරි 1කි.

ඉතිරි 1 යනු 1 ඒවා 1කි. එනම්, $\frac{1}{10}$ ඒවා 10කි. $\frac{10}{10} = \frac{10 \div 10}{10 \div 10} = 1$

7.5හි, 5 යනු $\frac{1}{10}$ ඒවා 5කි.

එවිට පළමු දශමස්ථානයේ $\frac{1}{10}$ ඒවා 15කි. $\frac{1}{10}$ ඒවා 15, 3න් බෙදමු. එවිට $\frac{1}{10}$ ඒවා 5යි ඉතිරි නැත.

එනම්, $7.5 \div 3 = 2.5$

11.7 අභ්‍යාසය

(1) අගය සොයන්න.

(i) $84.6 \div 2$	(ii) $167.2 \div 4$	(iii) $54.6 \div 3$
(iv) $98.58 \div 6$	(v) $74.5 \div 5$	(vi) $35.86 \div 2$
(vii) $0.684 \div 6$	(viii) $0.735 \div 7$	(ix) $1.08 \div 4$
(x) $7.401 \div 3$	(xi) $8.04 \div 8$	(xii) $11.745 \div 9$

(2) ළමයකුගේ උස 145 cm නම්, එම උස මීටරවලින් ප්‍රකාශ කරන්න.

සාරාංශය

- දශම සංඛ්‍යාවක් පූර්ණ සංඛ්‍යාවකින් ගුණ කිරීමේ දී දශම සංඛ්‍යාවේ දශමස්ථාන නොසලකා ගුණ කර ලැබෙන පිළිතුරෙහි දශම සංඛ්‍යාවේ දශමස්ථාන ගණනට සමාන දශමස්ථාන ගණනක් තබන්න.
- දශම සංඛ්‍යාවක් දහයේ බලයකින් දැක්විය හැකි සංඛ්‍යාවකින් ගුණ කිරීමේ දී දහයේ බලයේ 0 ඉලක්කම් තිබෙන ගණනට සමාන ස්ථාන ගණනක්, දශම සංඛ්‍යාවේ ඇති දශම තිත දකුණත් පසට ගමන් කරයි.
- දශම සංඛ්‍යාවක් දහයේ බලයකින් දැක්විය හැකි සංඛ්‍යාවකින් බෙදීමේ දී දහයේ බලයේ 0 ඉලක්කම් තිබෙන ගණනට සමාන ස්ථාන ගණනක්, දශම සංඛ්‍යාවේ ඇති දශම තිත වම් පසට ගමන් කරයි.